# Journal of Intangible Cultural Heritage

JICH (2025), Volume 4 (II)


# An Investigative Study into Public Religious Perspectives, Traditional Beliefs, and Socio-Cultural Dynamics Associated with the Hurulu Devala Procession

## හුරුළු දේවාල පෙරහැර පිළිබඳ ජනතාව තුළ පවතින ආගමික මතවාද, විශ්වාස හා විචල්‍යතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්


M. K. G. I. N. N. Malage Kumbura
External Degree and Extension Course Unit, University of Sri Jayawardhanapura, Kohuwala, Sri Lanka
*nilupulmalagekumbura200101@gmail.com



## *Abstract*

*Man is distinguished among other living beings by leading a cultural life. The heritage acquired through this culture is known as cultural heritage. It is twofold: intangible heritage and tangible heritage. Cultural elements that are not physically visible or touchable can be defined as intangible heritage. This includes skills, expertise, customs, rituals, music, and dance. Elements that are physically visible and tangible are considered tangible cultural heritage, such as clothing, food and drink, architectural designs, and weaponry. A procession (Perahera) can be defined as a process or a ritual performed since ancient times to understand a doctrine or creative process using auditory and visual media. People in different regions hold various beliefs and opinions regarding the cultural elements unique to those areas. Furthermore, the past and present changes in these elements are identified as 'variations' (Vivayathana). This research aims to investigate the religious ideologies, beliefs, and variations existing among the public regarding the Hurulu Devala Perahera. The primary objective is to identify the religious ideologies and beliefs held by the people concerning this procession. Secondary objectives include studying the variations and examining the system of customs and rituals associated with the Hurulu Devala Perahera. This research was conducted based on a qualitative research methodology, utilizing both library research and field study methods. In the library survey, an extensive literature review was conducted using research articles, books, journals, and the internet. For the field study, villages such as Padikaramaduwa, Gatalawa, and Diulwewa, which are nourished by the Hurulu Devala and Hurulu Wewa, were selected as study areas. Data was collected through in-depth interviews, questionnaires, and observations involving 50 experts in the field selected under non-probability sampling. Both participant and non-participant observation methods were employed. By analyzing the primary and secondary data qualitatively through thematic and comparative analysis, final conclusions were reached. It can be concluded that while certain elements of the procession now involve groups from art institutes instead of traditional dance troupes, these are often based on commercial factors, and certain rituals performed at the village level to achieve agricultural goals have also changed. Furthermore, it is observed that some rituals have been altered due to pandemic situations and the impact of globalization, leading to a gradual distancing of these ancient traditions from the modern youth. As a recommendation, the preservation of this traditional knowledge can be proposed.*



***Key words:*** *Hurulu Devala, Perahera, Public, Religious Ideologies, Variation.*

-

## 1. හැඳින්වීම

සත්ත්ව ලෝකයේ සෙසු සත්ත්වයන් අතරින් මිනිසා සංස්කෘතිකමය ජීවියෙක් වීම සුවිශේෂී වේ. මෙලෙස සංස්කෘතියෙන් උරුම වූ දෑ සංස්කෘතික උරුමය වශයෙන් හැඳින්වේ. මෙය අස්පර්ශනීය උරුමයන් හා ස්පර්ශනීය උරුමයන් ලෙස දෙයාකාර වේ. ඒ අනුව භෞතිකව දක්නට නොලැබෙන, ස්පර්ශ කළ නොහැකි සංස්කෘතික අංග අස්පර්ශනීය උරුමයන් ලෙස අර්ථ දක්වාලිය හැකිය. ශිල්ප, කුසලතා, සිරිත්-විරිත්, යාග-හෝම, සංගීත, නාට්‍ය යනාදිය මෙයට අයත් ය. භෞතිකව දක්නට ලැබෙන, ස්පර්ශ කළ හැකි සංස්කෘතික අංග ස්පර්ශනීය සංස්කෘතික අංග වේ. ඇඳුම්-පැළඳුම්, ආහාර-පාන, ගෘහ නිර්මාණ, ආයුධ යනාදිය පෙන්වා දිය හැකිය (වජිර, 1983, පිටː 18). බෞද්ධ පරිසරයක් තුළ ජීවත් වන අප සමාජයේ බෞද්ධයාගේ ඒකායන පරමාර්ථය නිර්වාණ සුවය වුවත්, මේ නිවන් මාර්ගයට ප්‍රවිෂ්ට වීමට අවබෝධ කරගත යුතු මෙම ගැඹුරු දහම අවබෝධ කරවීම විෂම වූ සමාජයේ සියලු දෙනාට එක හා සමානව සිදුකළ හැක්කක් නොවේ. විශේෂයෙන්ම රාග, ද්වේෂ, මෝහවලින් පිරී ඇති මේ මහා සමාජයේ සාමාජිකයන් හට මෙම ගැඹුරු දහම අවබෝධ කරලීමට ඉතාමත් සියුම්ව හා සූක්ෂමව කළ යුත්තක් විය. මේ සඳහා ඔවුන්ට හුරු වූ ශබ්දය හා රූපය නැතහොත් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපයෝගී කර ගනිමින් නිර්මාණශීලීව මෙම ගැඹුරු දහමට ප්‍රවිෂ්ට වීමට අතීතයේ සිටම අපගේ මුතුන් මිත්තන් එක්තරා සියුම් ක්‍රමයක් යොදාගෙන ඇත. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපයෝගී කරගනිමින් නිර්මාණශීලීව අතීතයේ සිටම පැවති එක්තරා වූ ක්‍රියාවලියක් නැතහොත් මෙම හරවත් වූ දහම අවබෝධ කරලීමට ශ්‍රද්ධාව වඩවන ක්‍රියාවලිය පෙරහැර වශයෙන් හැඳින්විය හැකිය (පතිරණ, 1973, පිටː 17).

ශ්‍රී ලංකාවේ පෙරහැර සාම්ප්‍රදායේ එන මහනුවර ඇසළ පෙරහැර සම්ප්‍රදාය වසර දෙදහකට වඩා ඈතකට දිව යන ප්‍රධාන සංස්කෘතික හා ආගමික උත්සවයකි (කරුණාරත්න, 2024, පිටː 267). මෙය 16 වන සියවසේ i වන විමලධර්මසූරිය රජුගේ පාලන සමයේදී ආරම්භ වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ පුරාවට මෙය ප්‍රචාරය වන්නට විය (සන්නස්ගල, n.d., පිටː 35). මේ ආකාරයට ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ප්‍රචලිත වූ දේව හා බෞද්ධ සංකල්ප අරබයා පෙරහැර සංස්කෘතිය ප්‍රචලිත විය. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හුරුළු දේවාලය සම්බන්ධව ද මෙම සංස්කෘතිය මුල් බැස ගෙන ඇත.

## සාහිත්‍ය විමර්ශනය

එස්.එම්.ඒ.පී. රත්නසිරි මහතා විසින් (2023) ප්‍රකාශයට පත්කළ පෙරහැර සංස්කෘතියේ නූතන විචල්‍යයතා නම් සාරසංක්ෂේපයෙහි නූතන දළදා පෙරහැර, සීනීගම හා දෙවිනුවර දේවාල පෙරහැරයන්හි ඇතැම් විචල්‍යතාවන් පිළිබඳ දක්වා ඇත. ඒ අනුව දෙවිනුවර දේවාලයෙහි ඇවරිය පන්දම වැනි අංග ඒ ආකාරයට ම තවමත් සිදු කොට ගෙන යයි.

කේ. වජිර මහතා විසින් (1983) රචනා කරන ලද දළදා ඉතිහාසය හා සංස්කෘතිය නම් ග්‍රන්ථයෙහි දළදා පෙරහැරෙහි ඉතිහාසය හා එහි නාට්‍ය අංග හා ජවනිකා පිළිබඳවත්, සිරිත් විරිත් පිළිබඳවත් දක්වා ඇත.

ඩේවිඩ් කරුණාරත්න මහතා විසින් (1994) සංස්කරණය කරන ලද එදා හෙළදිව නම් ග්‍රන්ථයෙහි දළදා පෙරහැරෙහි ඇතැම් අංග පිළිබඳ දක්වා ඇත. දේවාලයේ කපුරාල තෙමෝ අඩක් වැසී යන සෙ පටපිළි ඔතා මල් මාලවලින් සරසන ලද ලීයක් ගෙන

-

පෙරහැර කරයි. ජනතාව ඊට පුදපූජා කිරීමෙන් අනතුරුව කපුරාල මුඛවාඩමක් බැද දඬු කඩ තබා සරසන ලද හස්තියකු පිට නැගි නගරය පුරා වීථි සංචාරය කරයි. මිනිගෙඩි එල්ලා විසිතුරු ලෙස සරසන ලද අලි ඇතුන් සතලිස් ගනනක් ගමන් කරයි. තවද එවක සිටියා වූ යෝදයෝ, නළුවෝ මෙන්ම බෙර, දවුල්, තම්මැට්ටම්කරුවෝ සමුද්‍රඝෝශාවෙන් ශබ්ද කරමින් ගමන් කිරීම සිදුකරයි. එසේම නර්තන ශිල්පීන් ඇතුලු සාම්ප්‍රදායික විවිධ කලා අංග ක්‍රීඩා නර්තනානුසාරිව ඉදිරිපත් කිරීමක් දැකිය හැකිය. නිදසුන් ලෙස කළගෙඩි නර්තනය පෙන්වා දිය හැකිය (ඩේවිඩ්, 2014).

පී.බී. සන්නස්ගල මහතා විසින් (n.d.) සංස්කරණය කරන ලද දළදා විත්ති නම් ග්‍රන්ථයෙහි දළදා පෙරහැරෙහි ඇතැම් චාරිත්‍ර පිළිබඳ දක්වා ඇත.

බී. ඒ. පතිරණ මහතා විසින් (1973) රචනා කරන ලද පෙරහැර විසිතුරු නම් ග්‍රන්ථයෙහි දළදා පෙරහැරෙහි ඇතැම් නාට්‍යාංග පිළිබඳ දක්වා ඇත.

ඉහත කරුණු මඟින් පැහැදිලි වනුයේ දළදා පෙරහැර හා සෙසු පෙරහැර කිහිපයක පමණක් විචල්‍යතා සඳහන් වන බවය. නමුත් අනුරාධපුර, ගලෙන්බිදුණුවැව හුරුළු දේවාල පෙරහැරෙහි ආගමික මතවාද හා විචල්‍යයතාවන් හා විශ්වාස ගැන සියුම් ප්‍රාමාණික පර්යේෂණයක් ලියවී නොමැත. එම පර්යේෂණ හිඩැස පිරවීමට මින් උත්සාහ ගනු ඇත.

**පර්යේෂණ ගැටලුව**

හුරුළු දේවාල පෙරහැර පිළිබඳ ජනතාව තුළ පවතින ආගමික මතවාද, විශ්වාස හා විචල්‍යතා මොනවාද?

**පර්යේෂණ අරමුණු**

- ❖ හුරුළු දේවාල පෙරහැර පිළිබඳව ජනතාව තුළ පවතින ආගමික මතවාද සහ විශ්වාසය හඳුනාගැනීම.
- ❖ හුරුළු දේවාල පෙරහැරෙහි විචල්‍යතා පිළිබඳව අධ්‍යයනය කිරීම.
- ❖ හුරුළු දේවාල පෙරහැර සමග බැඳී පවතින සිරිත් විරිත් පද්ධතිය පිළිබඳව විමර්ශනය කිරීම.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක අධ්‍යයනය ක්‍රමවේදය මත පදනම්ව සිදු කරන ලදි. මෙහිදී පුස්තකාල ගවේෂණ ක්‍රමය හා ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමය භාවිත කරන ලදි. පුස්තකාල සමීක්ෂණ ක්‍රමයේදී පර්යේෂණ ලිපි, පර්යේෂණ කෘති, පොත්පත්, සඟරා හා අන්තර්ජාලය ආදිය භාවිතයෙන් පුළුල් පරාසයක සාහිත්‍යය විමර්ශනයක් කරන ලදි. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමය තුළදී හුරුළු දේවාලය හා හුරුළු වැවෙන් පෝෂණය වන පඩිකාරමඩුව, ගැටලාව, දිවුල්වැව ආදී ග්‍රාමයන් අධ්‍යයන ප්‍රදේශ ලෙස තෝරා ගනිමින් තෝරාගත් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් 50 දෙනෙකු සමඟ ගැඹුරු සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලී හා නිරීක්ෂණ මඟින් දත්ත ලබා ගන්නා ලදි. මෙහිදී සහභාගිත්ව හා සහභාගි නොවන නිරීක්ෂණ ක්‍රම ද්විත්වයම භාවිත කළේය. සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය යටතේ පර්යේෂකයා හුරුළු

-
පෙරහැර නර්තන අංගවලට සහභාගී වූ අතර පෙරහැර සංවිධාකයෙකු ලෙස ක්‍රියා කරමින් දත්ත ඒකරාශි කළේය.

මෙම පර්යේෂණය සම්මුඛ පර්යේෂණ ක්‍රියාවලියට පහත ආකාරයෙන් නියැදි කණ්ඩායම් තෝරාගන්නා ලදි.

| **සම්මුඛ පරීක්ෂණවලදී නියෝජන වන කණ්ඩායම්** | **සංඛ්‍යාව** |
|---|---|
| බස්නායක නිලමේ | 01 |
| කපු මහත්තුරු | 05 |
| පෙරහැරට සහභාගී වන නර්තන ශිල්පීන් | 15 |
| ජල පෝෂක ගම්වලින් තෝරාගත් සාමාන්‍ය ජනතාව | 20 |
| පෙරහැර නරඹන ජනතාව | 09 |

**වගු අංක 01 -** ***සම්මුඛ පරීක්ෂණවලදී නියෝජන වන නියැදි කණ්ඩායම්***

ප්‍රතිචාර පටිගත කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ සැසියේ දී හඬ පටිගත කිරීම යන්ත්‍රයක් භාවිත කරන ලදි. ලබාගත් ප්‍රාථමික හා ද්විතීයික දත්ත ගුණාත්මකව විවරණය කොට තේමාත්මක හා කථනාත්මක විශ්ලේෂණ ක්‍රම ඔස්සේ අවසන් නිගමනවලට පැමිණ ඇත.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### හුරුළු දේවාලයේ ආරම්භය

ජනකතා, ජනකවි මෙන්ම කෝල් මුර ආදිය විමර්ශනය කිරීමේදී ලේඛනගත සාක්ෂි නොමැති බොහෝ දේ සොයා ගැනීමට පහසුවේ. හුරුළු දේවාලයේ ආරම්භය සම්බන්ධයෙන් කිව හැක්කේද එවැන්නකි. හද්‍ර කාලිගේ කෝල් මුර කාව්‍යය එයට දෙස්දෙයි (චන්දන, 1997, පිට:85). මෙමඟින් අනාවරණය වන්නේ හුරුළු වැව "රිරි පිනුවැව" වශයෙන් මුල් කාලීනව හඳුන්වා ඇති බවයි. කෙසේ නමුත් මෙම හුරුළු දේවාලය වසර 350 වඩා පැරණි බව ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත මඟින් පැහැදිලි විය. හුරුළු දේවාලයේ සම්බන්ධව පවත්නා ප්‍රබල ජනප්‍රවාද තුනකි.

### පළමු ජනප්‍රවාදය

යාන් ඔය දෙපස කුඩා දූපත් දෙකක් පැවතුණි. මෙකී දූපත් දෙක විශාල වෘක්ෂයන් දෙකක් ද පිහිටා තිබුණි. උසින් සහ ප්‍රමාණයෙන් මෙම දූපත් දෙක සහ වෘක්ෂ දෙක සමානත්වයක් උසුලන ලද්දේය. යාන් ඔය නිම්නයේ දෙපස විසූ වැසියන් මේ වෘක්ෂයට භාරහාර වන ලද්දේය. දඩයමේ යන විට සහ මී කැඩීම සඳහා කැලෑ වදින විට මේ වෘක්ෂයට කොළ අතු එල්ලා තැබීම පැරැන්නන්ගේ සිරිතක් වූ බව ද පසුව මෙම දූපත්වල කුඩා දේවාල දෙකක් ඉදිවන ලද බව ද පැවසේ (චන්දන, 1997, පිට:39).

-

**දෙවන ජනප්‍රවාදය**

හුරුළු වැව මධ්‍යයේ විශාල දූපතක් පැවත ඇති අතර දූපත මධ්‍යයෙහි විශාල ගල් තලාවක් පිහිටියේය. මෙම ගල්තලාව අසල විශාල වෘක්ෂයක රත්රන් දේව රූපයක් තිබූ බවත්, වැව පිරෙන විට හා වැවේ වතුර සිඳී යන සමයෙහි ප්‍රදේශවාසීන් දූපතේ පිහිටි දේව රූපය උදෙසා භාර හාර වෙයි. කිසියම් පුද්ගලයකු විසින් මෙකී රත්රන් දේව රූපය සොරා ගෙන ඒ වෙනුවට රන් ආලේපිත ව්‍යාජ දේව රූපයක් තැබූ බව කියැවේ. මේ දේවාලයේ රත්‍රන් රූපය කතරගම දෙවියන්ගේ බව වැඩිහිටි ගැමියෝ අදටත් විශ්වාස කරයි (චන්දන, 1997, පිට:40).

**තෙවන ජනප්‍රවාදය**

දකුණු ඉන්දියාවේ සිට කතරගම දෙවියන්ට වූ භාරයක් ඔප්පු කිරීම පිණිස රත්තරන් දේව රූප රැගෙන පැමිණි දකුණු ඉන්දීය බ්‍රාහ්මණයන් පිරිසක් කෝවලා කුලම නමින් හඳුන්වන ලද ගමේ කුඩා ඔය ඉස්මත්තේ පිහිටි ගල්තලාවක දේව රූප තබා එදින රාත්‍රිය එහි ගත කර ඇත. පසුදා උදෑසන අවදි වූ ඔවුන් කතරගමට යාමට භාර කිරීම පිණිස රැගෙන ආවා වූ දේව රූප ගෙන යාමට සූදානම් වූ විට ඒවා එම ගල්තලාවේ සවි වී තිබී ඇත. ඉන්පසුව ඔවුන් පඬුරු නොමැතිව හිස් අතින් කතරගම බලා පිටත්ව ගොස් තිබේ. දිනක් උෟරන් දඩයමේ ගිය දඩයම් කරුවෙකු එම ස්ථානයෙන් ගමන් කරන විට මෙම දේව රූප දැක ඇත. වහා ඔහු කෝවලා කුලම ගම්වාසීන්ට මෙය දන්වා ඔවුන් සමඟ නැවත එම ස්ථානයට පැමිණ ඇත. රනින් නිම කරන ලද මෙම දේව රූප අතර ස්කන්ධ, වල්ලි, ඊශ්වර හා පුල්ලයාර ඇතුළු දේව රූප රැසක් තිබූ බව ද විශ්වාස කෙරේ. පසුව ගම්වාසීන් විසින් මෙම පළාත භාර මුදියන්සේ නැමැත්තාට දන්වා එකී ගමේ සහ අවට ගම්වාසී ගැමියන්ගේ ද ආධාර ඇතිව දේව රූප වැඩමවීමට කෝඩගමක් හෙවත් දෝලාවක් තනවන ලදි. එහෙත් දේව රූප එම ස්ථානයෙන් ඉවත් කර ගැනීමට ඔවුන්ට අපහසු වීම නිසා දින හතක් පුරාවට පූජා පෙරහැර පවත්වන ලදි. ඉන්පසු වර්තමාන හුරුළු වැවේ ඉස්මත්තේ තාවකාලිකව තනවන ලද කුටි දෙකේ දේව රූප වඩමවා තැන්පත් කර ඇති බව සඳහන්වේ (චන්දන, 1997, පිට:41).

මෙම ජනප්‍රවාද අතරින් අද වන විට පිළිගත හැකි ජනප්‍රවාදය ලෙස සැලකෙන්නේ මෙම ජනප්‍රවාදයයි. කෙසේ නමුත් උක්ත ආකාරයට ආරම්භ වී ඇති හුරුළු දේවාලයේ ආරම්භයේ පටන් මෙම දේවාලයට ම ආවේණික අයුරින් පෙරහැර පවත්වා ඇත. පසුව ඇසළ මාස පුර පසළොස්වක් පොහොය එළඹීමත් සමඟ පෙරහැරේ නිමාව සනිටුහන් කරයි.

**හුරුළු දේවාලයේ වාර්ෂික මංගල්‍යයන්**

ලක්දිව සෑම දේවාලයකම පාහේ වසරකට වරක් දෙවියන් හෝ යක්ෂයන් උදෙසා පෙරහැර පවත්වනු ලබයි. ඒ අතරින් කතරගම පෙරහැර එවැන්නකි. කතරගම පෙරහැර හා සම්බන්ධ හුරුළු දේවාල පෙරහැර එවැනි පෙරහැරකි. මෙම හුරුළු දේවාල පෙරහැර පූජා මංගල්‍යය කීපයක් දැකිය හැකිය. ඒ දේවාලයේ අනන්‍යතාව පිළිබිඹු කරන්නට සමත් වන්නකි. එම මංගල්‍යය මෙසේ දැක්විය හැකිය.

- අග්ගස් මංගල්‍යය
- දොරවහන මංගල්‍යය

-

- නානුමුර මංගල්‍යය
  - කාර්ති මංගල්‍යය
  - හුරුළු මංගල්‍යය

**හුරුළු මංගල්‍යය.**

මෙහිදී හුරුළු මංගල්‍යය පිළිබඳ අවධානය යොමුකිරීමේදී මූලික වශයෙන් හඳුනා ගත හැකි වන කාරණයක් වන්නේ අන් දේවාලවල මෙන් නොව ශ්‍රී දළදා මාළිගාවේ පෙරහැර අවසන් වූ පසුව මෙම හුරුළු දේවාල පෙරහැර ආරම්භ කිරීමයි. මෙමඟින් මොවුන් අපේක්ෂා කරන්නේ බුදු දහමට මූලිකත්වය ලබා දීමයි. එසේම මෙම පෙරහැර ක්‍රි.ව. 1950 දී පමණ ඉතාම සශ්‍රීක අයුරින් පැවැති බව ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත මඟින් තහවුරු වී ඇත. මෙම පෙරහැර සඳහා කප් සිටුවීම සිදුකරනු ලබන්නේ ඇසළ පෝයෙන් පසු පැමිණෙන පළමු අමාවක රාත්‍රියේදී ය. හුරුළු ගම් පලාතෙ මෙය හඳුන්වන්නේ කණු කැපීමේ මංගල්‍ය වශයෙනි. මේ සඳහා යොදාගනු ලබන්නේ ඇසළ ගසකි. මෙම කණු කැපීමේ මංගල්‍ය ප්‍රධාන වශයෙන් ගම් තුනකට පැවරී ඇත. ඒවා නම්,

- මීගහපට්ටිය ගම්මානය
- දඹගහඋල්පත ගම්මානය
- හල්මිල්ලෑව ගම්මානය

යනාදිය යි. අමාවකට කප් සිටුවීමෙන් පසුව මෙම දේවාල භූමියේ යාග කාලයක් ඇති බව සඳහන් වෙයි. මේ යාග කාලය තුළ දේවාලයේ සිටින කපු මහත්වරුන් හා බස්නායක නිලමේතුමා එක්වී මැටි මුට්ටි 12 ක් ගෙන බිමට වී අතුරා ඒ මත බුලත් කොළ 07 ක් හා පුවක් ගෙඩි 07 ක් බිම අතුරුවා මැටි මුට්ටි 12 ට වී පුරවනු ලබයි. මෙමඟින් මොවුන් අපේක්ෂා කරනු ලබන්නේ හුරුළු දේවාල භූමියට අයත් ප්‍රදේශවල ගොවිතැන්හි සශ්‍රීකත්වය යි. පසුව ඇතුළත පෙරහැර කතරගම දෙවියන් හා පත්තිනි දිව්‍යාංගනාව ප්‍රමුක කරගනිමින් ඊශ්වර දෙවියන්ට දින දෙකක් හා පුල්ලයාර දෙවියන්ට දින තුනක් පෙරහැර පවත්වයි. මේ කාලයේදී කතරගම දේව ආභරණ ඉහළ දේවාලයේ සිට පෙරහැර පවත්වන පහළ දේවාලය වෙත වඩම්මවනු ලබයි. තවද අවසන් රන්දෝලි පෙරහැර දිනයේ සන්ධ්‍යා භාගයේදී ඌරන් කෙළිය නමැති චාරිත්‍රයක් සිදුකරන බව ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත මඟින් පැහැදිලි විය. පසුව පසු දින අලුයම දිය කැපීම සිදු කරනු ලබයි. මෙහිදී ඊශ්වර දෙවියන්ගේ පිළිමයක් රැගෙන බස්නායක නිළමේ වැවට බැස දිය කැපීම සිදුකරයි. මෙම දිය කැපීමේ චාරිත්‍රයට පරම්පරාවෙන් පැමිණෙන කඩුවක් සහ පිත්තල මුට්ටියක් යොදා ගනු ලබයි. මේ චාරිත්‍රවලින් පසුව හුරුළු දේවාලයේ දිවා පෙරහැර පවත්වා පෙරහැර නිමා කරනු ලබයි.

**හුරුළු දේවාල පෙරහැර හා බැඳි මානව අභිචාර විධි**

ජන්මයේ පටන් හායනය දක්වාම දෛනික ගැමි ජීවිතය වටා තැවිරී තිබෙන අධි භෞතික බලවේග පිළිබඳ විශ්වාස හුරුළු ගම්පළාතේ තරුණ තරුණියන් අතරින් නැති වෙමින් යන නමුත් මේවා තවමත් ක්ෂය නොවී පවතිනුයේ වාර්ෂිකව අගෝස්තු මාසයේදී පවත්වනු ලබන හුරුළු මංගල්‍යය නමින් හඳුන්වන අනුස්මරණීය උත්සවය නිසාවෙනි. හුරුළු දේවාලය හා ආබද්ධව කෘත්‍යමය කාර්යභාරයක් ඉටු කරන ග්‍රාමීය අභිචාර විධි දේවාල පෙරහැරට කොතෙක් දුරට බලපාන්නේ ද යන්න අධ්‍යනය කිරීමද ඉතා වැදගත්

ය. හුරුළු ප්‍රදේශයේ ගම්වාසීන්ට ඇතිවන දෛනික අර්බුදකාරී තත්ත්ව පාලනය කිරීම සඳහා මොවුන් හුරුළු දෙවියන්ගේ පිහිට පැතීමට හුරු වී සිට ඇත. උපතේදී, අකුරු කියැවීමේදී, ඉඳුල් කටගෑමේදී, වැඩිවියට පැමිණීමේදී ආදී ධනාත්මක අර්බුධකාරී අවස්ථාවලදී හුරුළු දෙවියන්ගේ පිහිට පතයි.

*මහත්තයෝ අපේ දරුවෙකු ඉපදී තුන් මසක් ගතවීමට මත්තෙන් දරුවා රැගෙන ගොස් හුරුළු දේවාලයේ දෙවියන් වෙත භාර කරන්න ඕනි. මොකක් හරි හේතුවක් නිසා එය සිදුකර ගැනීමට නොහැකි වන හොත් දරුවාද රැගෙන ඇසළ මාසයේ පවත්වනු ලබන මහ පෙරහැරේ දරුවත් අරන් දේවාල භූමියට පයින් ම ගමන් කරන්ට ඕන.... (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2025.02.27)*

ඒසේම ස්වාභාවික අනතුරු, වසංගත රෝග, ජීවිත හානි ආදී නිශේධනාත්මක අර්බුදකාරී තත්ත්වවලදී ද දේවාලය මුල් කරගනිමින් මෙහි ජනයා බාරහාර වීම් සිදු කරයි. එහිදී රෙදිකඩක් හා කාසියක් ගෙන පඬුරු බැඳීම සිදුකොට දෙවියන්ගෙන් අයැද සිටින්නේ තමාට ඇතිවන අර්බුදකාරී තත්ත්වය පහසුවෙන් සමනය කර දෙන ලෙසයි. තම අභිප්‍රාය ඉටු වූ පසු කිරි ඉතිරවීම්, පලතුරු වට්ටි පූජා කිරීම්, පොල් පැළ පූජා කිරීම් ආදිය සිදුකරයි. විශේෂයෙන් ම මෙම ජනයා පූජා ඇල්ලීම සඳහා සහභාගි වීම අනිවාර්ය වේ.

*පුතේ අපට විවිධ කරදර බාධා ඇතිවුනහම අපි දේවාලයට ගිහින් පඬුරු බැඳ දෙවියන්ගෙන් ඉල්ලා සිටින්නේ අපේ කරදර බාධක දුරු කර දෙන ලෙසයි. අපේ ආයාචනයට දෙවියෝ සවන් දීලා අපේ කරදර බාධා දුරු කරලා දානවා. ඉතින් අපි තුටු පඬුරු පූජා කරනවා. ඒ වගේම තමයි පෙරහැරේ පූජා ඇල්ලීමේ කාර්යයට අපි අනිවාර්යයෙන්ම සහභාගී වෙනවා....(ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2025.02.27).*

එසේම මෙම හුරුළු ගම්පලාතේ සොරකමක් හෝ පුද්ගලයෙකුට අකටයුතු ක්‍රියාවක් සිදු වූ විට එම අකටයුතු ක්‍රියාව සිදුවූ පුද්ගලයින් මෙම දේවාලයට ගොස් වැරදි කරුට දඬුවම් දෙන ලෙස දෙවියන්ගෙන් අයැද සිටියි. මෙහිදී මෙම ගම්වැසියන් විසින් උදෑසන අලුයමින් දේවාලයට ගොස් දිව්වරුම් ගල අසලදී සොරාට දඬුවම් දෙන ලෙස දෙවියන්ගෙන් අයැද සිටියි.

ඒ අනුව හුරුළු පළාතේ ගැමියන් මෙම දිවුරුම හඳුන්වන්නේ දිවියා ගහනවා යනුවෙනි. මීට අමතරව සැකකරුවා හමු නොවේ නම් සොරකම පිළිබඳව දිවියා ගලේ දින හතක් පොල් ගසා සොරාට දඬුවම් දෙන ලෙස අයැද සිටියි. (චන්දන, 1997, පිටː63) මීට අමතරව මෙම හුරුළු පලාතේ කළු අභිචාර වැඩි වශයෙන් ම සිදුවන්නේ රීරි යකා, කාලයක්ෂණිය, මහසොහොන් යකා, බහිරව මුත්තා යන යක්ෂ යක්ෂණියන් මුල් කරගෙන ය.

ගවයන් සොරකම් කිරීම, අස්වැන්න ඇතුළු වෙනත් බව භෝග සොරකම් කිරීම ආදියට එහි අයිතිකරුවන් විසින් හුරුළු දේවාලයට පැමිණ දෙවියන් ඉදිරියේ රිදී කාසි ඔප්පු කර නැති වූ වස්තුව නැවත ලබා දෙන මෙන් ආයාචනා කරයි. මෙහිදී කෙම්මුර දින හතක් පුරාවට දේවාලයට ගොස් දෙවියන් ඉදිරියේ ආයාචනා කොට මෙම රිදී කාසිය ගිරයකින් දෙකඩ කොට එක් කොටසක් හුරුළු වැවටද අනෙක් කොටස දෙවියන්ට පඬුරු ලෙසද පූජා කරනු ලබයි. මෙමඟින් මෙම ජනයා අපේක්ෂා කරන්නේ සොරා විසින් සොරා ගත් මුළු සේසතම විනාශ වී යන බවයි (චන්දන, 1997, පිටː62).

-

**හුරුළු දේවාල පෙරහැරෙහි වර්තමාන විචල්‍යතා**

හුරුළු දේවාල පෙරහැරෙහි වර්තමාන විචල්‍යතා පිළිබඳව සලකා බැලීමේදී පැහැදිලි වන්නේ මෙම පෙරහැර වර්තමානය වන විට බොහෝ සෙයින් විචල්‍යතාවලට ලක්ව ඇති බවයි. මෙහිදී ප්‍රධාන වශයෙන් ම කොවිඩ් 19 වසංගත තත්ත්වයට පෙර වම් ඇල ඉවුර හා දකුණු ඇළ ඉවුර යන ඇල ඉවුරු දෙකෙන් දින හතක් පුරාවට පැවති මෙම පෙරහැර වසංගත තත්ත්වයෙන් පසුව දින දෙකකට සීමා විය. ඒ වම් ඇළ ඉවුරෙන් එක් පෙරහැරක් හා දකුණු ඇළ ඉවුරෙන් එක් පෙරහැරක් වශයෙනි.

> *පුතේ අපට ආපු කොරෝනා වසංගතය නිසා මේ වෙද්දි පෙරහැර දෙකක් විතරයි පවත්වන්නේ (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2025.02.28).*

එමෙන්ම අතීතයේදී අලුත උපන් දිළිඳුන් හුරුළු දේවාලයට භාර කිරීමෙන් පසුව ඔවුන් හට මෙම දේවාල පෙරහැර සඳහා සම්බන්ධ වීමට හැකියාව ලැබී ඇත. නමුත් මේ වන විට හුරුළු දේවාල දෙවියන්ට භාර භාර නොවූ විවිධ ප්‍රදේශවල පුද්ගලයන් ද විවිධ කලායතන මගින් මෙම පෙරහැරට සම්බන්ධ වීම සිදු වේ. එමගින් අතීතයේ පෙරහැරෙහි පැවති ග්‍රාමීය ජනයා අතර තිබූ කලා අංග ක්‍රමයෙන් වියැකී ගොස් ඇත. එමෙන් ම අතීතයේදී මෙම දේවාල පෙරහැරේ ගම්වැසියන් ඉතා උනන්දුවෙන් යුතුව මනා සැලසුමකින් තමාගේ ගම්මානයේ සිට කිලෝමීටර ගණනක් දුර බැහැර ගෙවාගෙන දේවාල භූමියට පිවිසීම සිදු වී ඇත. එසේ සිදු කරන්නේ හුරුළු දේවාල දෙවියන් පිළිබඳව ඇති අසීමිත භක්තිවන්තභාවයෙනි. නමුත් මේ වන විට මෙම හුරුළු දේවාල පෙරහැර ආරම්භ වන්නේ දේවාල භූමිය ආසන්නයේ සිට ය. එයට හේතුව වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනයේදී පැහැදිලි වූයේ වර්තමාන ජනතාව තුළ ඇති කාර්යබහුලතාවයි.

> *අපි ඉස්සර දුර බැහැර ගෙවාගෙන පෙරහැරෙහි ගමන් කරාට අද ඉන්න කට්ටියට පෙරහැර බලන්නටවත් යන්න වෙලාවක් නෑ (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2025.03.05).*

තවද අතීතයේ පෙරහැරෙහි ගම්මුන්ගේ සංස්කෘතිකාංගවලින් සුපරිෂණය වූ ඉතාමත් පෙරහැරක් නැරඹිය හැකි වුවත් වර්තමානය වන විට සියල්ලම මුදලට යට වී ගොස් ඇති බවක් පැහැදිලි වේ. එයට හේතු වශයෙන් පැහැදිලි වන්නේ විවිධ කලායතන මගින් නර්තන සම්ප්‍රදායන් මෙම පෙරහැරට එක්වීමත් වර්තමාන තරුණ පරම්පරාව මේ සඳහා උනන්දුවක් නොදැක්වීම ය.

> *අපි පොඩි කාලේ ඉඳන් හුරුළු දේවාල පෙරහැරේ නටපු කට්ටිය. ඒත් දැන් ඉන්න ළමයි පෙරහැරවල නටන්න කැමති නෑ. ඒ නිසා මුදල් දී කලායතන වලින් ළමයි මේ පෙරහැර සඳහා ගෙන්වා ගැනීමට සිදුවෙලා තියෙන්නේ (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2025.03.05).*

එමෙන් ම තම අස්වනු සාර්ථකව නිම කරවා ගැනීම නිසාවෙනුත් හුරුළු දේවාල පෙරහැර සාර්ථකව නිම කරගැනීමට හැකි වූ නිසාවෙනුත් ගම් හෝ මංසන්ධි මට්ටමින් කිරි ඉතිරි වීම සිදුකළ ද වර්තමානය වන විට එම චාරිත්‍රය වියැකී ගොස් ඇති බව පැහැදිලිව දැකිය හැකි ය.

එමෙන්ම අතීතයේදී පැවති විවිධ කලාංග වන ඔළු බක්කන් නැටීම, උඩ පැල් නිර්මාණ සාදා රැගෙන යාම, අලි ඇතුන් නිර්මාණය කිරීම, වගාවලට හිතකර සතුන්ගේ රූප

-
නිර්මාණය කර නර්තනයන් සිදුකිරීම යනාදිය මෙහි දැකිය හැකි තවත් එක් ලක්ෂණයකි. නමුත් මේ වනවිට මෙම කලාංග සියල්ලම අභාවයට ලක් වී ඇති බව පැහැදිලිව හඳුනාගත හැකි ය.

*ඉස්සර අපි ඔළු බක්කං සාදා පෙරහරට සහභාගී වී ඊළඟ අවුරුද්දේ පෙරහැර වනතෙක් අපේ නර්තන ඇඳුම් පැළඳුම් ඒ අයුරින්ම පරිස්සන්ව තබා ගත්තා (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2025.03.05).*

එමෙන්ම අතීතයේ ජනයා ඉතාමත් දේවභක්තියකින් යුතුව පෙරහැර සඳහා දින ගණනාවක් සිට පේවීම සිදුකළ ද වර්තමානය වන විට අතීතයේ මෙන් පේවීම සිදු නොකොට පෙරහැරට සම්බන්ධ වීම සිදු කරයි. එසේම අතීතයේ සිටි ජනයා තමාගේ බත බුලත සරුසාර කර ගැනීමේ අරමුණින් මෙම පෙරහැර සිදුකළ ද වර්තමානය වන විට සිටින ජනයා තාක්ෂණය හා නව්‍යකරණයට නැඹුරු වීම නිසා ඔවුන් මෙම පෙරහැරෙහි සම්බන්ධ වීමෙන් තම ජීවනෝපාය සාර්ථක වන බව පිළිනොගනී.

*පුතේ පෙරහැර නිසි ආකාරයෙන් සිදු කිරීමෙන් අපේ ගොවිතැන් බත් ඉතා සරුසාර වෙනවා. ඒ විතරක් නෙවෙයි අපි පෙරහැරට සම්බන්ධ වන්නේ ඉතාමත් සතුටෙන්.. (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2025.03.05).*

තවද මෙහි ජනයා කතරගම දෙවියන් සහ පත්තිනි දෙවියන් උදෙසා ප්‍රධාන වශයෙන් පෙරහැර සිදු කරන බව හඳුනාගත හැකි ලක්ෂණයකි. ඉහත කරුණු පිළිබඳව සලකා බැලීමේදී අතීත ජනයා හා වර්තමාන ජනයා අතර හුරුළු දේවාලයේ පෙරහැරෙහි විචල්‍යතා පැහැදිලිව හඳුනාගත හැකිය.

## 4. නිගමනය හා යෝජනා

මිනිසාට උරුම වන සංස්කෘතික උරුමයන් අතරින් අස්පර්ශනීය සංස්කෘතික උරුමයක් ලෙස පෙරහැර සංස්කෘතිය හඳුනාගත හැකිය. විශේෂයෙන් ම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපයෝගී කරගනිමින් අතීතයේ සිට ම පැවත එන ශ්‍රද්ධාව වඩවන ක්‍රියාවලියක් ලෙස පෙරහැර සංස්කෘතිය හඳුනාගත හැකිය. ඒ අනුව විවිධ ප්‍රදේශවල ජනතාව එම ප්‍රදේශයට ආවේනික වූ සංස්කෘතිකාංග පිළිබඳ ව සිතන ආකාරය විශ්වාස වේ. කෙසේ වෙතත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි, හුරුළු වැව ඉස්මත්තෙහි පිහිටා තිබෙන හුරුළු දේවාලය තුළ විශේෂිත වූ පෙරහැර සංස්කෘතිය හා එහි පවතින ආගමික මතවාද, විශ්වාස හා විචල්‍යතා පිළිබඳව අධ්‍යයනය කළ හැකිය. යම් ඓතිහාසික සංසිද්ධියක් ඔස්සේ විහිදී යමින් නිර්මාණය වූ මෙම හුරුළු දේවාලය මීට වසර 350කට පෙර ඉදි වූවක් බව ජනප්‍රවාදය සඳහන් වේ. කෙසේ වෙතත් මුල් කාලයේ පවුලේ දේවාලයක් වශයෙන් ක්‍රියාත්මක වූ මෙම හුරුළු දේවාලය ක්‍රිස්තු වර්ෂ 1953 හුරුළු ව්‍යාපාරයත් සමඟ මිනිසුන්ගේ වන්දනාමානයට පාත්‍ර වන ප්‍රධානත ම දේවාලයක් වශයෙන් එම ප්‍රදේශයේ ප්‍රචලිතව ඇත. විශේෂයෙන් ම මෙම දේවාලය බැඳි චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව සාකච්ඡා කිරීමේදී කප් සිටුවීම, පෙරහැර ආරම්භ කිරීම, දිය කැපීම ආදී වූ චාරිත්‍ර වාරිත්‍රවලට විශේෂිත වූ චාරිත්‍ර ප්‍රමාණයක් අඩංගුව ඇත. එමෙන් ම හුරුළු දේවාලය තුළ පවතින පෙරහැර සංස්කෘතියේ මානව ආකල්පය පිළිබඳ විමර්ශනය කිරීමේදී එම ප්‍රදේශයේ ජනතාව නිසි කලට වැසි නොලැබීම, තම ගොවිතැන්බත් පාලුවීම, සත්ත්ව උවදුරු පැමිණීම, දැඩි නියං තත්ත්වයන් සහ ග්‍රාමීය ජනයා විවිධ අනතුරුවලට ලක්වීම වැනි අකටයුතුකම්වලින් වැළකීම හේතු කොටගෙන මෙම

-
පෙරහැර පවත්වනු ලබයි. විශේෂයෙන් ම මෙම ප්‍රදේශයේ අලුත උපන් බිළිඳන් එම දේවාලයෙහි වැඩවාසය කරන කතරගම දෙවියන්ට සහ පත්තිනි දෙවියන්ට භාරභාර කිරීමත් එම ළමයින් විශේෂයෙන් ම මෙම පෙරහැර තුළ නර්තනාංගයේ යෙදිය යුතු බවට මතවාදයක් ද පවතී. ඒ වගේම වර්තමානය වන විට පෙරහරේ යම් යම් විචල්‍යතාවයන් දැක්වෙන අතර වම් සහ දකුණු ඇළ ඉවුරෙහි පෝෂක කළාපවල ජනතාව වර්තමානයේ පෙරහැර දෙකක් පමණක් සිදු කරයි. විශේෂයෙන් ම මීට මෑත කාලීනව පැවති වසංගත තත්ත්වය හේතු වූ බව ප්‍රකාශ කළ හැකිය. ඒ අනුව අතීත ග්‍රාමීය සාම්ප්‍රදායික නර්තනාංග රැසක් වර්තමානය වන විට පෙරහැර තුළ දැකගත නොහැකි අතර විවිධ කලායතනවල සුවිශේෂී වූ නර්තනාංග රැසක් මෙම පෙරහැර තුළ දැකගත හැකි වීම එහි විචල්‍යතාවක් ලෙස පෙන්වා දිය හැකිය. විශේෂයෙන් ම ගම්මුන්ගේ සංස්කෘතිකාංගවලින් සුපෝෂණය වූ අතීත පෙරහැර ඊට හාත්පසින් වෙනස් වූ මානයකට වර්තමානයේ මුදල් මත පදනම්ව සිදු වේ. විශේෂයෙන් ම තරුණ පරම්පරාව මේ සඳහා උනන්දුවක් නොදැක්වීමත් ඊට හේතු වශයෙන් පෙන්වා දිය හැකිය. ඒ අනුව වසංගත තත්ත්වය අනුව පෙරහැර යම් ආකාරයට විචල්‍යතාවකට බඳුන් වී ඇති බව නිගමනය කළ හැකි අතර ම ගෝලීයකරණයත් සමඟ වර්තමාන තරුණ පරම්පරාවගේ මෙම ජනප්‍රවාද මත විශ්වාස නොකිරීම සහ ඔවුන් මෙම ජනප්‍රවාදයන්ට ගරු නොකිරීම හේතුවෙන් මේවා විචල්‍යතාවයන්ට පත් වී තිබෙන බව නිගමනය කළ හැකි ය. එමෙන් ම ජනතාවගේ තිබූ මෙම පාරම්පරික ඥානය සුරක්ෂිත කිරීම ඒවා ඓතිහාසික කතිකාවතට එකතු කිරීම යෝජනා ලෙස ඉදිරිපත් කළ හැකිය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


කරුණාරත්න, ඩී. (සං). (2014). එදා හෙළදිව. ගුණසේන සමාගම.
චන්දන, ඕ. (1997). හුරුළු මංගල්‍යය. පෙතිකඩ මුද්‍රණ භාරය.
ගුණවර්ධන, වී.ඩී.එස්. (සං). (2008). දළදා සිරිත. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
පතිරණ, බී.ඒ. (1973). පෙරහැර විසිතුර. ඇම්.ඩී ගුණසේන සහ සමාගම.
රත්නසිරි, එස්.එම්.ඒ.පී. (2023). පෙරහැර සංස්කෘතියේ නූතන විචල්‍යතා.
සංගීත අධ්‍යනාංශ ජාත්‍යන්තර පර්යේෂණ පත්‍රිකා සමුළුව - 2023. සෞන්දර්ය විශ්වවිද්‍යාලය.
වජිර, කේ. (1983). දළදා ඉතිහාසය සහ සංස්කෘතිය. තිසර ප්‍රකාශකයෝ.
සන්නස්ගල, පී.බී. (සං). (ND). දළදා විත්තිය. ලේක් හවුස් ප්‍රින්ටර්ස්.